## අතීත ලෝකය

නවයුගය අප්‍රේල් කලාපයට එක්වූ මෙම ලිපිය පළවීමේ දී යම් යම් කොටස් අඩුවෙන් මුද්‍රණය වී තිබීම නිසා පාඨකයන්ගේ ඉල්ලීම මත මෙය යළි මෙසේ පළවෙයි

# යෝධ ගමන් ගැන යෝධයින්ගෙන් සාක්කි

## ඩයිනෝසරයින්ගේ ගති වලින් මහද්වීප ප්ලාවිතය තහවුරු වෙයි

මොරොක්කෝවට තරකම ග්‍රීස්ම ඍතුවක් ලබා තිබූ කාලයකි. දහවල් කාලයේ උණුසුම සෙල්සියස් අංශක 49 ක් ව තිබූ මේ කාලය අනුව දශකයේ අගභාගයයි. මොරොක්කෝවේ කැනීම් බිමක දූවිලි සුළඟින් ඇවිස්සෙමින් තිබුණේ ය. මේ දූවිල්ල මැද ඒ කිසිවක් ගණනකට නොගෙනම තමන්ගේ කටයුතු කරගෙන යමින් සිටියේ ඇමරිකානු හා මොරොක්කෝ ඒකාබද්ධ කැනීම් කටයුත්තකට පැමිණි චිකාගෝ සරසවියේ පෝල් සෙරිනෝ ය.




පෝල් සෙරිනෝ කල්පනා කළේ පොළොවෙන් මීටර් 100 ක් ගැඹුරු කැණීම් මට්ටමේදී ඩයිනෝසෝර ෆොසිල ලැබෙනු ඇත කියා ය. එහෙත් ඔහු මීටර් 100 මට්ටම පසුකොට බොහෝ ගැඹුරට කැනීම් භූමිය හාරා තිබුණත් සෙරිනෝ තවමත් සිටියේ හිස් අතිනි.

කැනීම් ආරම්භ කොට 41 වැනි දිනයේ දී කැනීම් බිමේ ඇවිදිමින් සිටි ගේබ්‍රියෙල් ගියෝන් අපූරු ෆොසිල කීපයක් සොයා ගත්තේ ය. පොළොවෙන් මීටර් 150 ක් ගැඹුරු කැනීම් මතුපිටකදී මේ ෆොසිල සොයා ගත් ගේබ්‍රියෙල් විද්‍යාඥයෙක් නොවේ. ඔහු තරුණ ලේඛකයෙකි. විද්‍යාත්මක ගවේෂණයක හැඩරුව දත් විද්‍යා ලේඛකයෙකි. ගේබ්‍රියෙල් සොයාගෙන තිබුණේ සෙරිනෝ සොයමින් සිටි දෙයකි. ගේබ්‍රියෙල්ට හමුවී තිබුණේ අවුරුදු මිලියන දශලක්ෂ 92 පැරණි ඩයිනෝසෝර ඇට කැබලි කීපයකි.

ඉදින් මේ ඇටකැබලි හමුවූ ප්‍රදේශය ආශ්‍රයෙන් දිගටම කැනීම් කටයුතු කරගෙන යාමට ගේබ්‍රියෙල් ගේ සොයා ගැනීම වැදගත් වූයේ ය. පර්යේෂකයෝ දිගටම කැනීම් කටයුතු කළෝ ය. අවසානයේ ඔවුන් මීටර් 8 ක් දිගැති ඩයිනෝසෝර ඇටසැකිල්ලක් ගොඩ ගත්තේ ය.

මේ ඇටසැකිල්ල අයත්ව සිටි ඩයිනෝසෝරයා මීට කලින් හඳුනාගෙන නැති විශේෂයකට අයත් එකෙක් බව පසුව අනාවරණය වූයේ ය.




මේ සොයාගැනීමේ වැදගත්කම හෙළිදරව් වීම ඇරඹුණේ එතැන් පටන් ය. මේ සොයා ගත් ඩයිනෝසෝර ඇටසැකිල්ල ප්‍රමාණය අතින් ගැලපුණේ මේ වන විට උතුරු ඇමරිකාවෙන් හමුව සිටි ඇලෝසෝරස් (Allosaurus) නම් ඩයිනොසෝරයාව ය. එහෙත් මේ අලුත් ඩයිනෝසෝරයාගේ ඇටසැකිල්ලේ ලක්ෂණ වලට අනුව එම සතා ඇලෝසෝරස්ට වඩා වේගයෙන් දිව ගිය සතෙකු විය යුතු ය.

අනෙක් අතට පර්යේෂකයින් දුටුවේ මේ ඩයිනෝසෝරයාගේ හිස් කබලේ ලක්ෂණ "ටිරැනොසෝරස් රෙක්ස් (Tyrannosaurus rex)ඩයිනෝසෝරයාගේ හිස් කබලේ ලක්ෂණ සමග ගැලපෙන බව ය. ටිරැනොසෝරස් රෙක්ස් යනුවෙන් හඳුන්වන්නේ මාංශභක්ෂක ඩයිනෝසෝරයෙකි. ඒ "ජුරාසික් පාක්" චිත්‍රපටයේ පෙන්වන මාංශ භක්ෂක ඩයිනෝසෝරයායි. අනෙක් අතට මිහිමත ඇවිද ගිය විශාලම මාංශ භක්ෂක සත්ත්වයා යි. එහෙත් අවසානයේ පර්යේෂකයින් තේරුම් ගත්තේ මේ අලුත්ම ඩයිනෝසෝර විශේෂයක් බවයි.

ඔවුන් මේ ඩයිනොසෝරයා නම් කළේ ඉන් පසුවයි. ඒ "ඩෙල්ටාඩ්‍රොමියස් ඇජිලිස් (Deltadromeus agilis) යන නමිනි. මීට ටික දිනකට පසුව ඩෙල්ටාඩ්‍රොමියස් ඇජිලිස්ගේ ලක්ෂණ තවත් අපූර්ව ඩයිනෝසෝරයකුගේ ලක්ෂණ සමග ගැලපෙන බව විද්‍යාඥයින්ට පෙනී ගියේ ය. මේ ඩයිනෝසෝරයා වූයේ "කාකරොඩොන්ටොසෝරස් සහරිකස් (Careharodontosaurus Sharicus) ය. මේ ඩයිනෝසෝරයා 1920 දශකයේ දී ඊජිප්තුවෙන් සොයා ගත් එකෙකි. එහෙත් ඒ සැකිල්ල දෙවැනි ලෝක යුද්ධ සමයේ විනාශ වී ගියේ ය.

මේ විදියට ඇමරිකාවෙන්, අප්‍රිකාවෙන් වගේම යුරෝපයෙන් හා ආසියාවෙන් ද හමුවන ඩයිනෝසෝරයින් විවිධ ලක්ෂණ අතින් එකිනෙකාට සමාන වීම බොහෝ කාලයක් තිස්සේ විද්‍යාඥයින්ගේ කුතුහලය ඇවිස්සූ සිදුවීමක් වූවේ ය. ඉතින් මේ අලුත් ඩයිනෝසෝර විශේෂය සොයා ගැනීමත් ඒ ඩයිනෝසෝරයාගේ ලක්ෂණ අනෙක් ඩයිනෝසෝර විශේෂවල ලක්ෂණ සමග ගැලපීමත් නිසා මේ ඩයිනෝසෝර අවුල ලිහා ගැනීමේ හොඳ පොටක් පැදී තිබෙන බව වාර්තා කළේ ජාත්‍යන්තර විද්‍යා සඟරාවක් වන "සයන්ස්(Science)" සඟරාව හා මේ කැනීම්වලට මුදල් ලබා දුන් ඇමරිකාවේ නැෂනල් ජියොග්‍රැෆික් (National Geographic)සඟරාවයි.

මේ සඟරාවට ප්‍රකාශයක් කරමින් ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර ස්වභාව ඉතිහාසය පිළිබඳ

42 පිටුවට

# යෝධ ගමන් ගැන...

29 පිටුවෙන්

කෞතුකාගාරයේ ජෛව පුරා විද්‍යාඥයකු වන මාර්ක් නොරෙල් කියා තිබුණේ, උතුරු ඇමරිකාවේ, ආසියාවේ හා දකුණු ඇමරිකාවේ ඩයිනෝසෝර ව්‍යාප්තිය පහදා දිය හැක්කේ මහද්වීප ප්ලාවිතය(Continental Drift) මගින් බවයි.

මහද්වීප ප්ලාවිතය වශයෙන් හඳුන්වන්නේ 1922 දී ඇල්ෆ්‍රඩ් වෙග්නර් නම් විද්‍යාඥයා විසින් ඉදිරිපත් කළ මතයකි. එම වාදයට අනුව දැනට සාගරයෙන් වෙන්ව පවතින ගොඩබිම් සියල්ලම මුල්කාලයේ පැවතියේ එකිනෙකට සම්බව ය. මේ ගොඩබිම් කලාපය හඳුන්වන්නේ පැන්ජියාව (Pangea) වශයෙනි. මේ ගොඩබිම කැඩියාම හෙවත් මහද්වීප ප්ලාවිතය ඇරඹුණේ අදින් අවුරුදු මිලියන 150 කට කලිනි. එනම් ජුරාසික යුගයේ දී ය. ඉදින් ජුරාසික යුගය එළඹෙන තෙක් කාලයේ පොළොව මතුපිට සිටි සතුන් සියළු දෙනා මේ තනි භූ තලයේ ඇවිද ගියේ ය. මේ භූමියේ ඩයිනෝසෝරයින් ඇවිද ගියේ අදින් අවුරුදු මිලියන 220 කට කලිනි. ඉදින් ජුරාසික යුගය වන විට මේ ඩයිනෝසෝරයින් පැන්ජියාව පුරා පැතිර සිටියේ ය.

පැන්ජියාව නමින් හඳුන්වන එම තනි භූතලය මුලින්ම බිඳී ගියේ උතුරු හා දකුණු කොටස් දෙකකට ය. උතුරින් වූ කොටස හැඳින්වෙනුයේ ලොරේසියාව (Laurasia)වශයෙනි. දැන් යුරෝපය හා උතුරු ඇමරිකාව ඒ කාලයේ තිබුණේ ලොරේසියාවේ ය.

ඒ වගේම පැන්ජියාවෙන් දකුණට බිඳී ගිය කොටස හැඳින්වෙනුයේ ගොන්ඩ්වානාව (Gondwana)වශයෙනි. දැන් දකුණු ඇමරිකාව, ඇන්ටාක්ටිකාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව හා මැඩගස්කරය ඒ කාලයේ තිබුණේ ගොන්ඩ්වානාවේ ය.

ඉදින් මේ මහද්වීප බෙදීයාමත් සමගම ඩයිනෝසෝරයින් ද බෙදී ගියේ ය. ඇමරිකාවේ මාර්ක් නොරෙල් කියන්නේ ඉන් පසුව මේ ඩයිනෝසෝරයින් මේ වෙන්වූ මහද්වීපවල වෙන් වෙන් විශේෂ විදියට පරිණාමය වූ බව තේරුම් ගැනීමට තාමත් පුළුවන් බව ය.

කොහොම නමුත් මහද්වීප ප්ලාවිත මතය මුල් කාලයේ පිළිගත් එකක් වූයේ නැත. එහෙත් භූ චුම්බකත්වයේ හැසිරීමත්, ලෝකයේ ගිනිකඳු හා භූමිකම්පා ක්‍රියාත්මක වීමත් ගැන විමර්ශනාත්මකව බැලූ විද්‍යාඥයින් පසුකාලීනව කීවේ මහද්වීප ප්ලාවිතය සැබවින්ම සිදු වූ අතර තව දුරටත් සිදුවෙමින් තිබෙන එකක් බවය. ඉතින් මේ විදියට ඩයිනෝසෝර විශේෂ අතර සම්බන්ධතාව හෙළි වීම මගිනුත් පැහැදිලි වන්නේ මහද්වීප ප්ලාවිතය සිදුවී තිබෙන බව ම මිස අන් යමක් නොවේ. ❑

**පාලිත අමරසූරිය**